# මහත්මා ගාන්ධිගේ චරිතයේ අවිහිංසාවාදී පාර්ශ්වය ගොඩනැගීමෙහි ලා ලියෝ තෝල්ස්තෝයි චරිතයෙන් ලද ආභාසය පිළිබඳ විමසුමක්

*දාබරේ, පී. ඩිල්ෂානි චතුරිකා* [1]

19වන සියවසෙහි ලොව ප්‍රබල රාජ්‍යයන් වශයෙන් දේශපාලනික බලපැවැත්වීම් බහුල දේශයන් දෙකක ජන්මය ලැබූ මෝහන්දාස් කරම්චන්ද් ගාන්ධි (1869-1948) සහ ලියෝ තෝල්ස්තෝයි (1829-1910) අනුදත් සමාජ සහ සාහිත්‍ය වපසරිය සුළුපටු නොවීය. තෝල්ස්තෝයිගේ ග්‍රන්ථ පරිශීලනයෙන්, ගාන්ධිගේ නිදහස් ව්‍යාපාර තතු හා ඒ සහානුබද්ධ ලිපි කියවීමෙන් සහ පෞද්ගලික ලිපි හුවමාරු මගින් ඔවුන් දෙදෙනා අතර ගොඩනගා ගනු ලැබූ මිත්‍රත්වය පිළිබඳවද විශාල සාහිත්‍යයක් ගොඩනැගී තිබේ. මහත්මා ගාන්ධි සිය අපිස් දිවිය උදෙසා අවශ්‍ය පෙළඹුම ලබාගන්නා ලද්දේ ලියෝ තෝල්ස්තෝයිගෙන්ය යන්න පිළිබඳව විවිධ දෙස් විදෙස් විචාර මත පවතී. මේ සඳහා මූලාශ්‍රය වශයෙන් තෝල්ස්තෝයි සහ ගාන්ධිගේ චරිතාපදාන, ඔවුන් විසින් හුවමාරු කරන ලද ලිපි සමුච්ච සහ ඒ පිළිබඳව ලාංකේය විචාරක විවරණ සහිත ග්‍රන්ථ හා ලිපි යොදා ගැනිණි. අන්තර් පඨිත පඨනය මෙහි භාවිත පර්යේෂණ ක්‍රමවේදය විය. තෝල්ස්තෝයි විසින් අත්හළ සිටුවර වරප්‍රසාද සහිත ප්‍රභූ ගරුත්වය ගාන්ධිගේ අවධානයට යොමු වූ අතර, ස්වයං නිමැවුම් වශයෙන් තමා විසින් සකසන ලද වස්ත්‍ර, පාවහන් ආදිය පරිභෝග කිරීමෙහි වැදගත්කම ඔහුට තවදුරටත් තහවුරු විණි. ගාන්ධි විසින් පවත්වාගෙන ගිය ඇතැම් ආශ්‍රම සඳහා තෝල්ස්තෝයි නාමය යෙදීමට තරම් මෙම පිටුබලය හේතු විය. එසේම තෝල්ස්තෝයි විසින් ගාන්ධිගේ නිර්මාංශ ප්‍රතිපත්තිය අනුගමනය කිරීමට පෙළඹිණි. සල්ලාල තරුණ දිවියෙහි මෙන් නොව පරිණත අවධියේදී තෝල්ස්තෝයි අනුදත් සාන්තුවර නොහොත් මුනිවර පිළිවෙත දෙස්-විදෙස් වියතුන්ගේ වෙසෙස් අවධානයට ලක්වූවකි. නිගමනය වශයෙන් දැක්විය හැක්කේ මහත්මා ගාන්ධිගේ අවිහිංසාවාදී ප්‍රතිපත්ති සඳහා වැඩි වශයෙන් ලියෝ තෝල්ස්තෝයිගේ බලපෑම ලැබී ඇති අතර, තෝල්ස්තෝයිගේ සරල දිවි පෙවෙත සඳහා ගාන්ධිගේ අනුබලයද උපකාරී වී ඇති බවයි.

**ප්‍රමුඛ පදඃ** අවිහිංසාවාදි ප්‍රතිපත්ති, නිදහස් ව්‍යාපාර, මුනිවර පිළිවෙත,

*[1]ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර, සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*dilshanidabare@gmail.com*